




# සමාප්ති මංගල්‍යය

"ස"

"සමාප්තිය"

"සමාප්ති
මංගල්‍යය ?"

උත්තර
භාරතීය
රාගධාරී
සංගීතවේදයට
අනුව මියැ-
සියේ මූලික
ස්වර සප්තකයේ මුල් ම ස්වරයයි "ස".

එහෙත් හෙළ ගී පුරාවතේ "ස" නමින් වඩාත් ප්‍රචලිත වූයේ ඒක පුද්ගල සංගීත ප්‍රසංගයක් යැයි කිවහොත් එය අතිශයෝක්තියක් නොවේ. වයස අවුරුදු තිස් එකක් වූ හද්‍ර යෞවන සංගීතවේදියෙකු විසින් මීට වසර 39කට පෙර ඇරඹූ අතිශය ජනප්‍රියත්වයට පත්වූ ඒකපුද්ගල සංගීත ප්‍රසංගයයි "ස".

එදා හැව්ලොක්ටවුමේ ලුම්බිණි රඟහල පිරී ඉතිරී ගිය රසික පිරිසක් ඉදිරියේ සිය ප්‍රථම "ස" ප්‍රසංගය සිය යෞවනයේ මෝහනීය හඬින් ගීතවත් කළේ ආචාර්ය වික්ටර් රත්නායක නම් වන ප්‍රවීණ සංගීතවේදීයායි. එදා එළෙසින් "ස" ප්‍රසංගය වෙනුවෙන් මුල්වරට විවර වූ ලුම්බිණී රඟහලේ තිර ඊට වසර තිස් නවයකට පසුව "ස" ප්‍රසංගයේ සමාප්තිය සනිටුහන් කරමින් වැසී යන්නට සැරසෙයි. එයයි "ස සමාප්ති මංගල්‍යය".

"සන්නස" මාසිකයේ "ගී සඳළුව" වෙනුවෙන් වැඩිම වාර ගණනක් අප හා එක් වූ වික්ටර් රත්නායක සංගීතවේදියාණන් මෙවර මෙලෙස එක් වන්නේ "ස සමාප්ති මංගල්‍යය" පිළිබඳව සැකෙවින් සිය අදහස් දැක්වීමටයි.

"අපි මුලින් ම "ස" ප්‍රසංගය වේදිකාගත කළේ 1973 ජූලි 20 වෙනිදා......"

වික්ටර් රත්නායකයන් දුරකථනය හරහා අපට සම්බන්ධ වෙමින් සාකච්ඡාවට මුල පිරීය.

"ඉතින් අපි මේ වෙනකොට අවුරුදු තිස් නවයක් පුරා ප්‍රසංග වාර එක්දහස් හාරසිය හතළිස් හතක් (1447) පවත්වලා තියනවා..."

"මම හිතන්නේ එක පුද්ගලයෙක් එකම නමකින් මේ තරම් ප්‍රසංග වාර ගණනක් පවත්වලා නෑ කියලයි...."

ඉන් ගම්‍ය වන්නේ එදා - මෙදා තුර "ස" ප්‍රසංගය දිනාගත් ජනප්‍රියත්වය ම නොවේද ? අනාගතයේ වුව මෙතරම් වාර ගණනක් ඒක පුද්ගල ප්‍රසංගයක් පැවැත්වීමට අපගේ හෙළ මියැසි අඹරෙහි ඉඩක් වෙන් වේ දැයි සැක සහිතයි. සහජ කුසලතා හා ඔප් නංවාගත් ශිල්පීය කුසලතා අනුව වර්ගීකරණය කර මාධ්‍ය හරහා බිහි කළ ශිල්පීන් වෙනුවට අද මාධ්‍ය මගින් බිහි කරනා "තරු" වලට අඹරෙහි ඇත්තේ ඉතා සුළු ඉඩක් බැව් මේ වන විටත් ප්‍රත්‍යක්ෂ වී හමාරය. එවන් තරු පිරි අඹරෙහි දිළෙනා සුපුන් වැනිය සියළු දෑ සපුරාගත් කලාකරුවා.

"ස" ප්‍රසංගය පටන් ගන්න දවස්වල අපිත් එක්ක හිටපු බොහොම දෙනෙක් අදඅ පි අතර නෑ. ඒ මුල් පිරිස අතර මහාචාර්ය සුනිල් ආරියරත්න, ප්‍රේමකීර්ති ද අල්විස්, කේ.ඩී.කේ. ධර්මවර්ධන, බණ්ඩාර විජේතුංග, ආර්. ආර්. සමරකෝන්, චින්තන ජයසේන, හරිස්චන්ද්‍ර වීරසිංහ, සෝමපාල රත්නායක වගේ හිතුවතුන් පිරිසක් හිටියා. ඇත්තටම කියනවා නම් ඔය අයගෙන් හරි අඩක්ම අද නෑ."

ඒ "ස" ප්‍රසංගය පිළිබඳව අප සංගීතවේදියාණන්ගේ මතකයෙන්. ඒත් ඉතින් ඇයි මේ "සමාප්තියක්" ?

"සිසිර, අපේ ජීවිත දැන් එදාට වඩා අවුරුදු තිස් නවයකින් වියපත් වෙලා. එදා තිබුණ රූප කාය, ජවය, ශක්තිය අද වියැකිලා ගිහින්. අෂ්ඨ ලෝක ධර්මය අපි පිළිගන්න ඕන."

ඒ බවක් ගායනටයෙන් නම් නොදැනේය, අප හට.

"අපේ ඒ ජවය, ශක්තිය ගැන තේරෙන්නෙ තමන්ට මයි සිසිර. රසිකයාට නෙවෙයි. එක දිගට ගීත විස්සක් විතර කියාගෙන යන්න ඕන කරන ශක්තිය තවමත් තියෙනවා. ඒත ඒක එදා තරමට ම නෙවෙයි කියලා දැනෙනවා."

"කලා කරුවෙක් කවදාවත් ජනතාවගේ අනුකම්පාවට ලක්විය යුතු නෑ. අනේ ඒ කාලෙනම් හොඳට කිව්වා. දැන්නම් අමාරුයි වගේ; වයසයිනේ..." වාගේ අදහස් රසිකයාගේ හිතට ඇවිත් කලාකරුවෙක් ඔවුන්ගේ අනුකම්පාවට ලක් වෙන්නේ ඇයි ? ඒ තත්ත්වයට එන්න කලින් අපි තීරණයක් ගන්න ඕන. ඇත්තටම අනුකම්පා-වට ලක්වීමෙන් හෝ අනුකම්පාවට පත් කිරීමෙන් කලාකරුවෙකුට වෙන්නෙ අගෞරවයක්."

"කලාකරුවෙක් තමන්ගෙ ප්‍රාගුණ්‍යය විදහා පාමින් කරපු රසවත් හරවත් නිර්මාණ, අර ශක්තීන් නැතිවෙනකොට අඩුවෙනවා. ඒ ගායනාවල ගැබ්වුන ගෞරවනීයත්වය, පෞර්ෂය, ප්‍රසාංගිකත්වය, ජනප්‍රියත්වය වගේ දේවල් එතකොට ඉබේම නැති වෙලා යනවා. අපි අර කතාවට කියන්නේ "බැරි මර ගාතේ...." කියලා. ඒ තත්වයට යන්න හොඳ නෑ."

මගේ ගුරුතුමා මහනුවර සිරිල් පෙරේරා සංගීතාචාර්ය තුමා නිතර අපට මතක් කරලා දුන්න අපේ පැරණි කියමනක් තියෙනවා;

"කරතොත් කරපන් හරියට
හැරිනම් පළයන් අහකට"

"ඉතින් යමක් හරියට කරන්න ඕන කරන ශාරීරික, මානසික, ශිල්පීය ශක්තීන් අපි වියපත් වෙනකොට පිරි-හෙනවා. එතකොට ශිල්පියා දැනගන්නවා තමන්ගේ තත්වය. මේකට අපි කියන්නේ "ශිල්පීය ඥාණාන්විත අවබෝධය" කියලයි. තමන්ගේ ගායනාවල පෙර තිබුණු අපූර්වත්වය අඩු වීගෙන යනකොට ඒ බව අවබෝධ කරගැනීම හරි වැදගත්. එතකොට අර රසිකයන් අතරේ තමන් ලබාගත් ගෞරවනීයත්වය රැකගෙන ඉවත් වෙන්න පුළුවන්. ඒ ගෞරවනීයත්වය රැඳේවි සදහටම ඒ අයගේ මතකයන් එක්ක.

සයුර විළස කැළඹෙයි
යළිත් ඔබ - දෙරන විළස සැතපෙයි
එතැන අරුම නොහැඟෙයි
මගේ සිත - ඒ ගැන තවම සිතයි !

විලෙන් නෙලූ මල් විලට නොලන සේ
සඳෙන් ලැබූ රැස් සඳට නො දෙන සේ
ඔබෙන් ලැබූ දුක් ඔබට නො දෙන්නෙමි
මා නෙත් පියෙන තුරා.....

ඔබේ දයාබර සිතුම් සමූහය
ගතින් ඈත් මුත් සිතින් සමීපය
දෙ අතක දෙතැනක තනි වී සිටිය ද
දෙ හදම එක ය ප්‍රියේ...

රචනය : ප්‍රේමකීර්ති ද අල්විස්
තනුව, සංගීතය හා ගායනය: වික්ටර්

ඒ "ස" ප්‍රසංගයේ සමාප්තිය පිළිබඳව. ඉතින් කුමක්ද මේ "සමාප්ති මංගල්‍යය" ?

"ප්‍රසංග වාර ගණනක් සළකලා බලපුවම අපිට හිතුණ ප්‍රසංග එක්දහස් හාරසිය පනහකින් (1450) නවත්වන එක හොඳයි කියලා. ඒ කියන්නෙ තවත් ප්‍රසංග තුනක් කරන්න ඕන එක්දහස් හාරසිය පනහ සම්පූර්ණ වෙන්න. ඉතින් මේ සමාප්ති මංගල්‍යයට "ස" ප්‍රසංග තුනක් ඇතුලත් වෙනවා. ජූලි මාසේ දහ අට වෙනිදා (18) නොළුම් පොකුණේ දී ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙනුත්, දහ නව වෙනිදා (19) මහරගම යොවුන් රඟහලේ දී පණ්ඩිත් අමරදේවයන්ගේ ප්‍රධානත්වයෙනුත් විසි වෙනිදා (20), ඒ කියන්නේ "ස" ප්‍රසංගය පටන් අරගෙන අවුරුදු තිස් නවය පිරෙන දා හැව්ලොක්ටවුමේ ලුම්බිණි රඟහලේ දී ම මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේ ප්‍රධානත්වයෙනුත් මේ ප්‍රසංග තුන පැවැත්වීමට සංවිධානය කරනවා."
"ස" සමාප්තිය සමඟින් යුගයක අවසානයක් ද වන්නා සේ හැඟෙයි. සැබැවින්ම එය එසේම ද ?

"වික්ටර් රත්නායක කියන ශිල්පියා "ස" ප්‍රසංග එක්ක බද්ධ වෙලා හිටපු බව ඇත්ත. ඒත් වික්ටර් කියන්නේ වෙනම ම ශිල්පියෙක්. ගැයීමට අපහසු ගීත විස්සක් විතර එක දිගට ගැයීම වෙහෙසකර බව දැනෙන නිසා "ස" ප්‍රසංගය සමාප්ත කළාට මගේ ගායනයේ සමාප්තිය නෙවෙයි මේ. තවත් කලක් ගැයීමට පුළුවන්කම තියෙන බව දැනෙන නිසා දැන්ම මම ගායනයෙන් ඉවත්වන්න හිතුවේ නෑ..."

වික්ටර් රත්නායක සංගීතවේදියාණන්ගේ සුපුරුදු ලෙන්ගතු සිනහව දුරකථනය තුලින් ගලා එයි. ඒ සිනහවේ මෙන්ම හඬෙහි තවමත් එදා වූ තාරුණ්‍ය හා මිහිරියාව රැඳී ඇත්තේය.

රත්නායක සංගීතවේදියාණන් කී සේම තවමත් රැඳී ඇති සිය ගායන හැකියාව, තාරුණ්‍යය හා මිහිරියාව මොනවට විදහාලමින් මෑතකදී ගැයූ ගීත සමුච්චයක් පසු ගිය දා මව් බිමේ පේරාදෙණිය සරසයියේ දී "නිල් කඳු යාය" නමින් එළි දැක්විණි. හැත්තෑව දශකයේ දී තදින්ම රසික හද බැඳගත් සුන්දරතම ගී සොළොසක් ගොනු කොට, නැවත පටිගත කර මෙම සංගීත තැටිය ඉදිරිපත් කළේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ විද්‍යාර්ථීන්ගේ සංගමය විසිනි.

වික්ටර් රත්නායකයන්ගේ ම මෙම සද්කාර්යය පිළිබඳව දැනගෙන පෞද්ගලික හිතවතෙකු වූ එස්.බී. විජේකෝන් ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවරයා මඟින් රසිකයින් අතට පත් වන ක්‍රමවේදයක් අසන්නට නොලැබීණ. මෙවන් අගනා මියුරු ගී එකතුවක් එම සංගමයේ සාමාජිකයිනට පමණක් සීමා නොවනු ඇතැයි අපි සිතන්නෙමු. තවත් එවන් හිතවතෙකු අතේ සංගත තැටිය අප අතට පත්කළ අප මිත්‍ර විජේකෝන් මහත්මාට පින් අනු-මෝදන් කරමින් එහි වූ මියුරුතම ගීයක පද "ගී සඳළුව"ට එක් කරන්නේ "කට පාඩමිනි." ගී පද රචනය ප්‍රේමකීර්ති ද අල්විස් ප්‍රවීණ නිබන්ධකයාගේය. අවසන, අප හා සාකච්ඡාවට එක් වූ වික්ටර් රත්නායක සංගීතවේදියාණන්ට ද අපගේ පුණ්‍යානුමෝදනාව කරන්නේ සිය ඉදිරි කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා !" ය යන පැතුමත් සමඟිනි. මුල් ම "ගී සඳළුව" වෙනුවෙන් අප හා එක් වූ රත්නායකයන් වෙනුවෙ-න් එදා එම ලිපිය සැරසූ කළු - සුදු ආලේඛ්‍ය චිත්‍රය (පුද්ගල රූපය) මෙවරත් "ගී සඳළුව" සරසන්නේ ය.

සිසිර දිසානායක

